# විශ්වවිද්‍යාල සිසුන්ගේ තොරතුරු ගවේෂණ කුසලතා වර්ධනය කිරීමෙහිලා විශ්වවිද්‍යාල පුස්තකාල සතු භූමිකාව

*ඩී. එම්. සකුන්තලා කුමාරිහේරත්*[1]

තොරතුරු සුලභතාවය හමුවේ පාඨකයාට තම තොරතුරු අවශ්‍යතාවයට ගැළපෙන පරිදි නිවැරදි වූ තොරතුර කුමක් ද යන්න තෝරා ගැනීම දුෂ්කර කටයුත්තක්ව ඇත. තොරතුරු යනුවෙන් අප අදහස් කරන්නේ ලබන්නාට යම්කිසි දැනුමක්, අවබෝධයක් ලබාගත හැකි ආකාරයට සංවිධානය කරනු ලබන දත්ත සමූහයකි. සිසුන්ගේ තොරතුරු ගවේෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සහ වැඩසටහන් විශ්වවිද්‍යාල පුස්තකාල විසින් අනුගමනය කරන්නේ ද, යන්න විමසීම මෙම අධ්‍යයනයෙහි ගැටලුව විය. අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වූයේ විශ්වවිද්‍යාල පුස්තකාල විසින් පාඨක තොරතුරු ගවේෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල පවතින ගැටලු සහ සීමිතතා මොනවාදැයි හඳුනා ගැනීමයි. උප අරමුණු වූයේ දැනට විශ්වවිද්‍යාල සිසුන් අතර පවතින තොරතතුරු ගවේෂණ කුසලතා මොනවැදැයි හඳුනාගැනීම සහ පාඨක තොරතතුරු ගවේෂණ කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය යෝජනා සහ ක්‍රමවේද ඉදිරිපත් කිරීමයි. මෙම අධ්‍යයනයේ දී දත්ත රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා , ප්‍රශ්නාවලී සහ නිරීක්ෂණය , යන ක්‍රම යොදා ගැනිණි. එහිදී ද ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කිරීම සිදු කෙරිණි. එය සිදු කෙරුණේ මෙරට ජාතික විශ්වවිද්‍යාල 03ක් වන කොළඹ විශ්වවිද්‍යාලය , කැළණිය විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවල ප්‍රධාන පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් සමඟිනි. එම පුස්තකාලාධිපතිවරුන් සහ සහ අහඹු ලෙස තෝරාගත් උපාධි අපේක්ෂකයන් 25 දෙනෙකු වෙත 2014 අධ්‍යයන වර්ෂයේ පළමු අර්ධවාර්ෂිකය තුළ තෝරා ගත් දින 03ක දී ප්‍රශ්නාවලී බෙදා හරින ලදී. ඉහත විශ්වවිද්‍යාල පුස්තකාල තුළ පවත්වාගෙන යනු ලබන උපදේශන වැඩසටහන් සඳහා පාඨක සහභාගීත්වය අවම බවත් , ග්‍රන්ථ සොයා ගැනීම සඳහා පාඨකයින් සෘජුවම පොත් රාක්කය වෙත යොමුවන බව ද සෑම පාඨකයෙකුම සිය තොරතුරු අවශ්‍යතා සපුරාගැනීම සඳහා පුස්තකාලය වෙත යොමු වුව ද ඔවුන්ගේ සෑම තොරතුරු අවශ්‍යතාවයක්ම පුස්තකාලය තුළින් නොසපිරෙන බව ද අධ්‍යයනය මඟින් අනාවරණය කර ගත හැකිවිය.

Key Words: University Libraries, Information Needs, Readers, Information Literacy, Information

[1] ප්‍රදර්ශක, සීඩා /සරෙක් පර්යේෂණ පුස්තකාලය,කැලණියවිශ්වවිද්‍යාල, dissanayakasaku@gmail.com